# සූර්යබල, සුලං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

# පුරප්පාඩු දැන්වීමයි

# ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන යථා යෝග්‍ය පරිදි සුදුසුකම්ලත් අයවළුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. එම තනතුරු සඳහා රජය විසින් අනුමත කර ඇති වැටුප් පරිමාණයන් මත ස්ථිර සේවයට පත්වීම් ලබාදෙනු ලැබේ.

## අධ්‍යක්ෂක (මූල්‍ය)

**සුදුසුකම් හා පළපුරුද්ද (පහත 1 හෝ 2)**

01. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ගිණුම්කරණය / මූල්‍ය කළමනාකරණය / වාණිජ්‍යය / ව්‍යාපාර පරිපාලනය / ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම

**සමග**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ගිණුම්කරණය / මූල්‍ය කළමනාකරණය / වාණිජ්‍යය / ව්‍යාපාර පරිපාලනය / ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ අදාළ ක්ෂේත්‍රයේ "මාස්ටර්ස්" උපාධියක් ලබා තිබීම හෝ වෘත්තීයවේදී වරලත් ආයතනයක (ACA/ACMA/ACCA) ආශ්‍රිත සාමාජිකත්වය හෝ සමාන සුදුසුකම් ලබා තිබීම

**සහ**

රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්ද.

02. මූල්‍ය / ගිණුම්කරණය (ACA / ACMA / ACCA) පිළිබඳ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තියවේදී වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය

**සහ**

රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්ද

**වැටුප් පරිමාණය :**

HM 1-1-2016 රුපියල් (80,295 - 15 x 2, 270 - 114,345)

(රජය අනුමත කර ඇති අනෙකුත් අදාළ දීමනාද ගෙවනු ලැබේ)

## සහකාර අධ්‍යක්ෂක (ඉංජිනේරු) - තනතුරු 07

**සුදුසුකම් හා පළපුරුද්ද**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන බලශක්තියට අදාළ විදුලි හෝ යාන්ත්‍රික ක්ෂේත්‍රයන්හි ප්‍රථම උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL), ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

**වැටුප් පරිමානය :**

MM1-1-2016 - රුපියල් (53,175-10x1,375-15x1,910 - 95,575)

(රජය අනුමත කර ඇති අනෙකුත් අදාළ දීමනාද ගෙවනු ලැබේ)

**සියලු තනතුරු සඳහා අදාළ වයස් සීමාව :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල / රාජ්‍ය අංශයේ ආයතනවල සේවයේ නියුතු අය හට අදාළ නොවනු ඇත)

**ඉල්ලුම් කළයුතු අන්දම :**

අයදුම්කරුවන් සිය සම්පූර්ණ ජීව දත්ත තොරතුරු සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපින හා දුරකථන අංක සමග අයදුම්පත් සියලු අදාළ සහතික පත්‍ර වල සහතික කරන ලද පිටපත් ද සමග 2021 මැයි මස 19 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවතේ, අංක 72 හි, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ, අධ්‍යක්ෂ ජනරාල් වෙත, ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්කරනු ලබන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කළ යුතුය.

රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල / රාජ්‍ය අංශයේ ආයතනයන් හි සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් සලකා බලනු ලැබීමට නම් අදාළ ආයතන වල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය,**
**අංක 72, ආනන්ද කුමාරස්වාමි මාවත,**
**කොළඹ 07.**